# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1867/3 - 2014 ජුනි මස 16 වැනි සඳුදා - 2014.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතන වල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

පක්ෂ සාමාජිකයකුව සිටීම අවසන් වීම හේතු කොට ගෙන ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අනුර උදය මුණසිංහ මුණසිංහ ආරච්චිගේ නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඩී. එම්. පියදාස දිසානායක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතන වල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඩී. එම්. පියදාස දිසානායක මහතා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම් භාර නිලධාරී,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 02 වන දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

07 - 10

1A - G 019727 — 75 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*